# රස කවි පිංචි



ලිනුකි රවින්‍යා ජයවර්ධන

# රස කවි පිංච

ලිනුකි රවින්‍යා ජයවර්ධන

# රස කවි පිංච

කතෘ ප්‍රකාශනයකි

ප්‍රථම මුද්‍රණය 2026

කවි සහ චිත්‍ර

**ලිනුකි රවින්‍යා ජයවර්ධන**

2 ශ්‍රේණිය C

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

ISBN 978 - 624 - 211 - 344 - 9

# <u>පිදුම</u>

මුතු මල් වගේ අකුරු
ලස්සනට අමුණන්න
මට කියලා දුන්න
ආදරණීය
"තමිලා ගුරුතුමියට"
රස කවි පිංච
සෙනෙහසින්
පුදමි.



# පෙරවදන

දිනෙන් දින සංකීර්ණ වන ගෝලීය අනාගත ලෝකයට දියණියන් සූදානම් කරණ බාලිකා අධ්‍යාපනයේ හැරවුම් ලක්ෂයක් ලෙස මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් සිදුකරණ හේමමාලා උපහාර ගත්කරණ ව්‍යාපෘතිය නම් කළ හැකිය. දශකයක තරම් කාලයක් දහස් ගණනක් දැයේ දරුවන් ගත්කතුවරුන් ලෙස දැයට දායාද කරන්නට හැකිවීම පාසලක් වශයෙන් ලබන විශිෂ්ඨ ජයග්‍රහණයකි. මෙවරද වෙනත් පාසල් හා එක්ව පාසල් දරුවන්ට නව අත්දැකීම් සමුදායක් සන්නිවේදන නිපුණතා සාර ධර්ම මෙන්ම නිර්මානාත්මක ප්‍රවර්ධණය වැනි බහුවිධ කුසලතා සංවර්ධනය අරමුණු කොටගෙන පොත් ලියන්නට යොමුකරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ලියැවී ඇති ළමා ග්‍රන්ථ තුළින් ලෝක බෞද්ධ ජනතාවගේ පූජනීය සංකේතය කන්ද උඩරටට අගයක් එකතු කළ ශ්‍රී දළදා වහන්සේ වැඩකර වූ හේමමාලා කුමරියට උපහාර දැක්වීම මෙවර අපගේ මූලික අරමුණයි. මේ සඳහා නිර්මානකරණයෙන් දායක වූ පාසල් දරුවන් මගපෙන්වූ ගුරුභවතුන් ඇතුලු සැමට ස්තුතිය පුද කරමු.

ශශිකලා සේනාධීර
විදුහල්පතිනිය
මහාමායා බාලිකා විද්‍යාලය

# ආණ්ඩුකාරතුමාගේ සුභාශිංසන පණිවුඩය

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලය ආරම්භ කර ඇති හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් නිර්මාණය වූ ග්‍රන්ථ එළිදැක්වීම වෙනුවෙන් මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරවර වශයෙන් සුභාශිංසන පණිවිඩයක් එක් කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සළකමි.

අධ්‍යාපනය යනු සමාජයේ ප්‍රගතියට මූලික පදනම වන අතර, එය පොත්පත් හා සාහිත්‍ය නිර්මාණ හරහා තවදුරටත් ශක්තිමත් වේ. සිසු දරුවන්ගේ දක්ෂතා, නිර්මාණශීලිත්වය හා බුද්ධිමය හැකියාවන් මෙවැනි ව්‍යාපෘති මගින් මතුවීම ඉතා ප්‍රශංසනීය බව පැහැදිලිය.

මෙම ග්‍රන්ථකරණ ව්‍යාපෘතිය තුළින් සිසු දරුවන්ට පමණක් නොව, සමස්ත සමාජයටම වටිනා දැනුමක් සහ අගනා සාහිත්‍ය දායාදයක් ලබාදෙනු ඇති බව මම විශ්වාස කරමි. එමෙන්ම, මෙවැනි උත්සාහයන් තුළින් අනාගතයේ ශ්‍රී ලංකාවට අභිමානයක් වන ලේඛිකාවන් බිහිවනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

මෙම සාර්ථක කටයුත්ත සඳහා කැපවූ විදුහල්පතිතුමිය, ගුරු මණ්ඩලය, සිසු දරුවන් සහ සම්බන්ධ වූ සියලු දෙනාට මාගේ හෘදයාංගම ප්‍රශංසාව සහ ආශිර්වාදය පිරිනමමි. මෙම ව්‍යාපෘතිය සහ ග්‍රන්ථ එළිදැක්වීමේ උත්සවය විශිෂ්ට සාර්ථකත්වයක් ලබනු ඇතැයි ප්‍රර්ථනා කරමි.

සරත් බී. එස්. අභයකෝන්,
ආණ්ඩුකාරවර, මධ්‍යම පළාත.
සම්මානිත මහාචාර්ය, පේරාදෙණිය විශ්වවිද්‍යාලය.
2026.05.10

# දියවඩන නිලමෙතුමාගේ සුභාශිංසන පණිවුඩය

වත්මන් පාසල් පද්ධතිය තුළ දූ දරුවන් ග්‍රන්ථකරණයට යොමු කිරීමේ අරමුණින් මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් මහනුවර කලාපයේ සෙසු පාසල්වල සහභාගිත්වයෙන් මෙවර පරම පූජනීය ශ්‍රී දළදා වහන්සේ ලක්දිවට වැඩමකළ හේමමාලා කුමරියට උපහාර පිණිස ග්‍රන්ථ එළිදැක්වීමේ ව්‍යාපෘතියක් සංවිධානය කළ මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය ඇතුළු ආචාර්ය මණ්ඩලය, ශිෂ්‍ය දියණිවරුන්, සෙසු පාසල්වල ශිෂ්‍ය දූ පුතුන් සහ මෙම ව්‍යාපෘතිය සැලසුම්කර ක්‍රියාවට නැංවීමට කැපවූ සියලු දෙනාගේ විශිෂ්ට වූ උතුම් ප්‍රයත්නය අතිශයින් අගය කරමි.

ශ්‍රී ලංකාව දශක කිහිපයක් තිස්සේ සියලු දරුවන්ට නිදහස්, අනිවාර්ය, ගුණාත්මක හා සාධාරණ අධ්‍යාපනයක් ලබා දීමටත් එමඟින් අනාගතයේදී බුද්ධිමත් කුසලතා පූර්ණ පුරවැසි පරපුරක් බිහි කිරීමටත් කැපවී සිටී. එවන් පසුබිමක සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, විචාරශීලි චින්තනය ඇතුළු ධනාත්මක අංග ලක්ෂණ සංවර්ධනය වී අනාගත දැනුම් පාදක සමාජයක් නිර්මාණය කිරීමට පාසල් දරුවන්ගේ මෙම ග්‍රන්ථකරණ වැඩසටහන හේතු පාදක වේ. ශ්‍රී දළදා සමිඳු සරණින් හේමමාලා උපහාර ග්‍රන්ථකරණ ව්‍යාපෘතියේ සියලු කටයුතු සාර්ථක වේවායි මම ප්‍රාර්ථනා කරමි.

ප්‍රදීප් නිලංග දෑල,
දියවඩන නිලමේ,
ශ්‍රී දළදා මාලිගාව,
2026.05.10

# පටුන


| | | |
|---|---|---|
| 01 | ළිනුකි | 09 |
| 02. | මගෙ සුදු අම්මා | 10 |
| 03. | මගෙ ආදර අප්පච්චි | 11 |
| 04. | මගෙ සුදු මල්ලි | 13 |
| 05. | මගේ පාසල් මෑණිය | 14 |
| 06. | මගේ ආදර ගුරුතුමිය | 15 |
| 07. | මගේ සුරතල් පූස් පැංචා | 16 |
| 08. | දේදුනු යාළු | 17 |
| 09. | ඉර මාමා | 19 |
| 10. | හඳ මාමා | 20 |

# ලිනුකි

දුවන්න ආසයි -
පනින්න ආසයි
සෙල්ලම් ගේ බත් උයන්න ආසයි
නටන්න ආසයි -
ගයන්න ආසයි
පාසල් යනවා -
අකුරු ලියනවා
දොස්තර නෝනා
කෙනෙක් වෙලා
රටට සේවෙ කරනවා
ඒ මම තමයි....
ලිනුකි ....



# මගෙ සුදු අම්මා

රස කෑම මට කවනවා
මාව පාසල් එක්කරන් යනවා
ලෙඩ උනාම මගේ
ළඟම ඉන්නවා
මගේ සුදු අම්මා

මාව නාවලා
සුවඳ කරනවා
ලස්සන කවි කතා කියනවා
තුරුළු කරන් මාව ඉඹිනවා
මගේ සුදු අම්මා

කිරි සුදු පාටයි
හරිම ලස්සනයි
මගේ සුදු අම්මා



# මගෙ ආදර අප්පච්චි

මාව වඩාගෙන ගේ
ඇතුලෙ දුවනවා
ලූනු ලූනු කියලා ලූනු
පිටේ ගෙනියනවා
සරම් ඔන්චිල්ලාවෙ
මාව පද්දනවා
අලියා පිටේ මාව
ගෙනියනවා
රට රකිනා
රණ විරුවෙකි
මගේ ආදර අප්පච්චි



# මගේ සුදු මල්ලී

හැම තිස්සෙම අම්මා ළඟම
තුරුල් වෙලා ඉන්න ඕන
ලස්සනට හිනාවෙන
මගේ සුදු මල්ලියා



රදින් තමයි එයාගෙ නම
අත්පුඩි ගසනවා -
උඩ පනිනවා දුවනවා
මගෙ පොත් ඇදලා දානවා
පැන්සල් අරගෙන කුරුටු ගානවා
මාත් එක්ක සෙල්ලම් කරනවා
මගේ සුදු මල්ලි

# මගේ පාසල් මැණිය

"මහාමායා"
තමයි මගෙ අකුරු කරන
ආදර පාසල් මැණිය
වැව රවුමේ තියෙන්නෙ එය
දළදා මාළිගාව ළඟ
ජීවිතය ජයගන්න
අපිව යහ මග යවන
මහාමායා පාසල් මැණී!
සැරදේවා !



# මගේ ආදර ගුරුතුමිය

මල් වගෙ ලස්සන
අකුරු ලියන්න
පාට පාට
චිත්‍ර අඳින්න
කවි සිංදු කියලා
නටන්න
මට කියලා දුන්න
"තමිලා ගුරුතුමිය"
තමයි මගේ ආදර
ගුරුතුමිය!



# මගෙ සුරතල් පූස් පැංචා

ඥාව් ඥාව් ඥාව් කියලා
මගේ ළඟට වෙලා ඉන්න
පුළුන් බෝලයක් වාගේ
පූස් පැංචා
හරිම හපනා
බතුයි කිරියි
    එකට කන්න
සෙල්ලමටත්
    හරිම දඟයා
මගේ පුංචි පූස් පැංචා



# දේදුනු යාළු

ලස්සන ලස්සන පාට ගොඩක්
තියාගෙන ඉන්න දේදුනු යාළුවේ
පාට පාටින් ලස්සනට චිත්‍ර අඳින්නට
අපේ පාට පෙට්ටිවලට
පාට දුන්නෙ ඔයාදෝ
ලස්සන දේදුනු යාළු





# ඉර මාමා

දිලිසි දිලිසි හරි සතුටින්
කන්ද උඩින් පායනවා
අලුත් දිනක් ලෝකය වෙත
උදේම අරගෙන එනවා
හිනැහි හිනැහි
ඉර මාමා



# හඳ මාමා

හා පැංචෙක් තුරුල් කරන්
පුළුන් වලා උඩ ඉඳගෙන
පෝය දවසට අපිට පන්සල්
යන්න එළිය දෙන හඳ මාමා
අපි එක්කම පන්සල් යන
හරි ලස්සන හඳ මාමා



# පසුවදන

අධ්‍යාපන අමාත්‍යාංශ අනුමැතියෙන් දශකයකට වැඩි කාලයක් පාසල් දරුවන් දහස් ගණනක් ගත්කතුවරුන් දැයට දායාද කළ මෙම ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය පාසල් අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයට බෙහෙවින්ම උපකාරී වූ වැඩසටහනක් බව අධ්‍යාපනඥයින්ගේ පිළිගැනීමයි. නව අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වලට සමගාමීව මෙවර පාසල් දරුවන් පර්යේෂණ කෘතියක් රචනා කරන්නට යොමුකර වීම ව්‍යාපෘති ගමන් මගේ හැරවුම් ලක්ෂයකි. ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් ඇල්ෆා පරම්පරාවකට අනාගත ලෝකය පෙන්වාදෙන නූතන පාසල නූතන තාක්ෂණික මෙවලම් මෙන්ම පොතපත ද සමව පරිහරණය කළ යුතු බව පර්යේෂණාත්මකව පෙන්වා දෙන්නේ පොතකින් දරුවෙකුට ලැබෙන ආශ්වාදය අන්කිසිවකින්වත් ලබාදිය නොහැකි නිසාය.

තවමත් අප අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලම මෙන්ම මානව දැනුම ගබඩා වී ඇති පොතපතින් දරුවන් දුරස්වීම වළක්වාගන්නට මෙන්ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධණය වෙනුවෙන් වසර ගණනාවක සිට මෙම ව්‍යාපෘතියට උරදී සිටින මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ මූලිකත්වයෙන් **හේමමාලා උපහාර** ග්‍රන්ථ කරණ ව්‍යාපෘතිය දියත්වෙයි. පාසල් දරුවන් තුළ ශාස්ත්‍රීය හික්මීම මෙන්ම සාර ධර්ම නිපුණතා සංවර්ධනයත් යුගයේ අවශ්‍යතාවයක් වන කාන්තාව සවිබල ගැන්වීමට ඉතිහාසයේ යුග මෙහෙවරක් ඉටුකළ හේමමාලා කුමරියට උපහාර දැක්වීම ද මෙහි මූලික අරමුණයි.

මහනුවර මහාමායා බාලිකා විද්‍යාලයේ දියණියන්, විදුහල්පතිනිය, ගුරුභවතුන්, දෙමාපියන් ආදී ශිෂ්‍යාවන් සහ සෙසු පාසල් නියෝජනය කරන සියලු දෙනාට ද දියවඩන නිලමෙතුමන් ඇතුලු ශ්‍රී දළදා මාළිගාවේ කාර්ය මණ්ඩලයට ද මෙම සද්කාර්ය වෙනුවෙන් උපහාර දක්වමු.

සෙනෙවිරත්න මහලේකම්
(ව්‍යාපෘති නිර්මාතෘ)